# "රෑ සර ගී" ගන්වනු මැන "තාරකාවියේ"



'කල් යල් බලා නිසි කල් පැමිණි කල්හි, සෑම කල්හි රැස් කරගත් දේ සදා කල්හි රඳනා සේ රඳවන්නට සමත් වන්නෝ, නුවණැත්තෝම වන්නාහුය.'

ජීවිතයෙන් අප සාක්ෂාත් කරගත් දේ සනාථ කරවන්නට ගත් කදිම උත්සාහයකි, රුක්මන් විමලසූරිය සහෘදයාගේ ''තාරකාවියේ'' ගී එකතුව. සිය කුළුඳුල් ගී එකතුව එළිදක්වන ගී ප්‍රසංගය රුක්මන් නම් කරන්නේ, ''රෑ සර ගී'' නමින්.

ලැබුවාවූ නව වසරේ මාර්තු 6 වෙනිදා සවස 6.00 ට, ''ෆොරස්ට් හිල්'' පාසලේ ''කෙල් වොට්සන්'' රඟහලේ ගීතවත් වීමට සූදානම් වෙමින් සිටින රුක්මන් සමඟින් එක් වීමු අපි, ''රෑ සර ගී'' දක්වා තමන් ආ ගමන් මඟ පිළිබඳව කතිකාවතක් වෙනුවෙන්.



''මගේ ගම්පළාත තමයි මාතර. ඒ වුනත් පාසැල් අවධියේ වැඩි කාලයක් අපි පදිංචි වෙලා හිටියෙ මොරටුවේ. මාතර, විල්සන් විමලසූරිය මගේ පියායි. තංගල්ලේ, නාලිනී ජයසිංහ තමයි මගේ මව. අපේ පවුලේ පස් දෙනෙක් අතරින් මම දෙවෙනියා.''

''පුංචි කාලෙ ඉඳන්ම මට ගීත අහන්නත් ගීත ගායනා කරන්නත් ලොකු ආසාවක් තිබුණා. සංගීතය මුලින්ම ඉගෙන ගන්න ලැබුණේ මොරටුවේ වේල්ස් කුමාර විද්‍යාලයේදී. මගේ ඒ කාලේ සංගීත ගුරුවරයා වුනේ ජෙරාඩ් පීරිස් මහත්මයා. ඒ දවස්වල මම එස්රාජ් වාදනය ඉගෙන ගත්තා. පස්සෙ කාලෙක කොළඹ ආනන්ද මහා විද්‍යාලයට ආවට පස්සෙ, අනිල් මිහිරිපැන්න සංගීතාචාර්ය තුමාගෙන් බටනලා වාදනයත් ඉගෙන ගන්න වාසනාව ලැබුණා.''

රුක්මන් ආනන්දයේ ශිෂ්‍යභට හේවිසි තූර්ය වාදක කණ්ඩායමේ එවකට ප්‍රධාන බටනලා වාදකයා වුවද, කණ්ඩායමේ වාදනය කළ අන් සියළු වාද්‍ය භාණ්ඩද වාදනය කිරීමට සමත් වූවා. එමෙන්ම, ආනන්දයේදී රැජින බාළදක්ෂ පදක්කමත්, ටේබල් ටෙනිස් යුගල ශූරතාවයත් දිනා ගැනීමට සමත් වීම විශේෂයෙන් සටහන් කළ යුතුයි.

''මම පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුලත් වුණේ පශු වෛද්‍ය පීඨයටයි. ඒත් කලා කටයුතු වලට දිගින් දිගටම සම්බන්ධ වුනා. සරසවියේ ගාන්ධර්ව සභාව පවත්වපු ආධුනික ගායනා තරඟයෙන් මට පළමුවෙනි ස්ථානය ලැබුණෙ, වික්ටර් රත්නායක මහත්මයා ගායනා කරපු ''තනි තරුවේ'' ගීතය ගායනා කිරීමෙන්. ඊට පස්සෙ අවුරුද්දේ සරසවියේ පවත්වපු වේදිකා නාට්‍ය තරඟයෙ-න්, මට දක්ෂතම නළුවාට හිමි සම්මානයත් ලැබුණා. ඒ ''පිපාසෙට කරදිය'' නාට්‍යයේ ප්‍රධාන චරිතය රඟපෑම වෙනුවෙන්.''

පශු වෛද්‍ය වරයෙක් වශයෙන් රාජකාරියේ යෙදී සිටියදීත්, ඔහු විසින් භක්ති ගීත කණ්ඩායම් පුහුණු කර ඇත. තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබන කාලයේදීද, රුක්මන් විසින් මෙම කටයුතු දිගටම කරගෙන යන ලදී.

වර්ෂ 1994 දී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ රුක්මන්, මෙල්බන් නුවර පැවැත්වුණ සංගීත ප්‍රසංග සංවිධානයේදී දුන් දායකත්වය අනුප-මේයයි. වික්ටෝරියානු ආදි ආනන්දීයයන් ''මෙල්බන් ආට්ස් සෙන්ටර්'' හිදී ඉදිරිපත් කළ ප්‍රථම හෙළ ගී ප්‍රසංගය වූ ''රන් ස්වර ධාරා'', ඒ අතරින් විශේෂයෙන් සඳහන් කළ යුතුයි. ඒ අත්දැකීම් ඇසුරින් හර්ෂ බණ්ඩාර ජයලත් සහෘදයා සමඟින් ඊළඟ වසරේදී එම ශාලාවේදීම පැවැත්වීමට යෙදුණ ''සුරස සුසර'' ප්‍රසංගයට සහභාගී වූයේ, පණ්ඩිත් අමරදේවයන්, විශාරද නන්දා මාලිනිය, වික්ටර් රත්නායකයන් හා රෝහණ වීරසිංහයන්.

ප්‍රවීණයින් විසින් මෙල්බන් නුවර පැවැත්වූ ගී ප්‍රසංග වලදී අත්වැල් ගායනයෙන් දායක වීමටද රුක්මන් වාසනාව ලැබීය.

''ගායකයෙක් වෙන්න ආපු මේ ගමනේදී, මෙල්බන් වලදී මුලින්ම වේදිකාවකට නැංගේ ''මියුරු සර'' ප්‍රසංගයෙන්. යුරෝක් බෞද්ධ විහාරයට ආධාර රැස්කරන්න පවත්වපු මේ ප්‍රසංගයේ ගී ගයන්න මට අත දුන්නේ, විජිත අමරසේකර සංගීත ශිල්පියායි.''

''මෙල්බර්න්හි ''වොක්ස් ස්කූල් ඔෆ් සිගිං'' වෙතින් බටහිර ගායනා ක්‍රමත්, ''සංඛ පද්ම'' කලායතනයේ වාසනා වීරකෝන් සංගීතාචාර්ය වරියගෙන් පෙරදිග ගායනා ක්‍රමත් හැදෑරුවා. තවත් ගායනය ප්‍රගුණ කර ගන්න තියෙන උනන්දුව නිසාම, ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න මහත්මයා ගාවටත් ගියා. දැනටත් මම තරුපති මුණසිංහ සංගීතවේදියාගෙන් ගායනය හදාරනවා.''

මෙල්බන්හි පදිංචි ගීත රචකයෙකු වන මහින්ද දිසානායක දිවුල්ගනේ මහත්මා ලියූ ''සඳ කුමරියගේ'' ගීය රුක්මන් ගැයූ මුල්ම ස්වතන්ත්‍ර ගීය වන අතර, එය මෙල්බන් රසිකයින් අතරට විවිධ මාධ්‍ය හරහා පත්වූවා.

''මම ''තාරකාවියේ'' ගීත එකතුවට ගීත තෝරන-කොට, ගුණාත්මක අගයට මුල්තැන දුන්නා. ඒ වගේම විවිධ ශෛලියේ ගීතත්, විවිධ තේමා යටතේ ලියවුණ ගීතත් එක් කර ගත්තා. ප්‍රවීණයින් වගේම නවකයින්ගේත් හොඳ දේ එකතු කර ගත්තා. ප්‍රවීණ ගායන ශිල්පීන් එක්ක කළ යුග ගායනා තුනකුත් මේ ගීත එකතුවට ඇතුලත් වෙලා තියෙනවා.''

**රුක්මන් විමලසූරිය ගේ ''තාරකාවියේ'' ගී එකතුව මාර්තු 6 වෙනිදා සවස 6.00 ට, ''ෆොරස්ට් හිල්'' පාසලේ ''කෙල් වොට්සන්'' රඟහලේ දී එළිදැක්වෙයි**

පසුගිය කාලයේදී, වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික ගායන ශිල්පී සංගමයේ (Victorian Association of Sri Lankan Singers) නැත්නම් ''වාස්'' සංවිධානයේ උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික වැනි තනතුරු දරමින්, මෙල්බන් නුවර ගායන වේදිකාව හැඩගන්වන්නට මහත් පරිශ්‍රමයකින් කටයුතු කළ රුක්මන්ට, තමන්ගේම ගී එකතුවක් එළිදක්වන්නට නිසි කාලයයි මේ.

කල් යල් බලා නිසි කල් පැමිණි කල්හි, සෑම කල්හි රැස් කරගත් දේ සදා කල්හි රඳනා සේ රඳවන්නට සැරසෙන රුක්මන්ට, අපේ සුභ පැතුම්

**සිසිර දිසානායක**





